**සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම - 2020**
**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කල මතය

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිනිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයේ යොමුව සමඟ අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 12) 88 ඡේදයට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු (ESC) සම්බන්ධ රු. මිලියන 159.5 ක තක්සේරුව සහ රු.මිලියන 75.5 ක දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ආර්ථික සේවා ගාස්තු (ESC) පියවීම් දීර්ඝ කරන ලෙස ඉල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) ලිපියක් යවා ඇති අතර ආර්ථික සේවා ගාස්තු පියවීම් සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය (CEB) සමඟ සුහද ගිවිසුමක් ඇති කර ගන්නා තෙක් මේ සම්බන්ධයෙන් සමාගමට එරෙහිව කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයකින් හෝ බදු පැනවීමෙන් වළකින ලෙස ද ඉල්ලීමක් කරන ලදී. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස සත්‍ය වශයෙන්ම සිදු නොවූ, රේගුවේ වටිනාකම සඳහා පිරිවැයට සියයට 10 ක ආන්තිකයක් එකතු කරන ලබයි. කෙසේ වෙතත්, සමාගම විසින් පිරිවැය මත සියයට 10 ක ආන්තිකයක් ලෙස රු.මිලියන 3,653 ක් ආදායමට එකතු කර ඇති අතර පසුව සමාගම ණය ගැතියන්ට එම වටිනාකම වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට අයකර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම් සමාන ප්‍රමාණයකින් අධිගණනය වී තිබුණි. | 2018 ජූනි 28 වැනි දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙත වැට් බදු ඉන්වොයිසි නිකුත් කිරීමේ පිරිවැයට රේගු ආන්තිකය එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) වෙත මඟ පෙන්වීමක් ලබා දෙන ලදී. එතැන් පටන්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම මඟ පෙන්වීම අභියෝගයට ලක් කර ඇති අතර ඔවුන්ගේ 2018-09-07 දිනැති ලිපිය මගින් දේශීය ආදායම් වෙත ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. | මෙම කාරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) උපදෙස් ලබා ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය |

| | | |
|---|---|---|
| (ආ)සමාලෝචිත වර්ෂය අවසානයට වසර 3 ක් ඉක්මවූ රු.මිලියන 10.6 ක ලැබිය යුතු හිඟ කළමනාකරණ ගාස්තු සඳහා සමාගම විසින් කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයෙහි අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදන) [AGM (Gen)] ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) වෙතින් කළමනාකරණ ගාස්තු සඳහා "සියලු වියදම් කළේ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගණුදෙනුවලට" බව පවසමින්, සාධාරණීකරණ ලිපියක් එවන ලෙස ඉල්ලා සිටියේය.මෙම කරුණ ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගැනීමට නියමිතය. එම ලිපිය යැවීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය මෙම හිඟය පියවනු ඇත. | සමාගම විසින් දිගුකාලීනව ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සකස් කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)පවතින ලියවිලි වලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි වටිනාකම ප්‍රකාශ නොකිරීම හේතුවෙන් සමාගම රු. මිලියන 205ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබුණි. 2019 වසරේ සිදු කරන ලද දඩ මුදල් ගෙවීම, අදාළ වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු ගෙවිය යුතු වැට් බදු ගිණුම, වැට් පාලන ගිණුම සහ සී/ස ලංකා නැව් සංස්ථාව (CSCL) වගකීම් ගිණුම යටතේ හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රඳවාගත් ඉපැයීම් රු. මිලියන 205කින් වැඩියෙන් දක්වා ඇති අතර, සමාලෝචිත වර්ෂය යටතේ ශ්‍රී ලංකා රේගු වැට් බදු ගෙවිය යුතු ගිණුම, වැට් පාලන ගිණුම සහ CSCL වගකීම් ගිණුම පිළිවෙලින් රු. මිලියන 158.2, රු. මිලියන 40 ක් සහ රු. මිලියන 6.8 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම (LCC) 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශ කර නොමැත. | සමාගම මෙම ගෙවීම දඩ වියදම් ලෙස සටහන් කර මෙම ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ)මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් නොවූ රු.මිලියන 4ක මුදලක් සමාගම විසින් 2019 දී සිංගප්පූරු සමාගමකට සී/ස ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා ගෙවා තිබුණි.කෙසේ වෙතත්, සමාගම විසින් මෙම මුදල සී/ස ලංකා නැව් සංස්ථාව විසින් ගෙවිය යුතු ශේෂයෙන් වැරදි ලෙස අඩු කර ඇත. එබැවින්, වගකීම් සමාන ප්‍රමාණයකින් ඌණ ගණනය කර තිබුණි. | මෙම ගෙවීම 2019 වර්ෂයේදී සී/ස ලංකා නැව් සංස්ථාව හරහා සීමාසහිත එම්/එස් මර්කේටර් (පුද්ගලික) සමාගම (Mercator Singapore (Pvt) Ltd)වෙත සිදු කර ඇති අතර මර්කේටර් වගකීම් මූලාශ්‍රය/සම්භවය සොයා බැලීම සඳහා විමර්ශනය කරනු ලබන අතර ඒ අනුව ලංකා නැව් සංස්ථාව වෙත අදාළ සටහන් සම්මත කරනු ඇත. | සමාගම වගකීමෙහි මූලාරම්භය සොයා ගත යුතු අතර ගිණුම්වල ශේෂයන්ගේ පැවැත්ම සහතික නොකර ගෙවීම් නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා භාණ්ඩ ප්‍රවාහන ගාස්තු සහ වැට් බදු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද රු.මිලියන 285.4 ක මුදලක් වෙනම හෙළිදරව් නොකර, එය "තාප ගල් අඟුරු නැව්ගත කිරීම් සඳහා වන වෙළඳ ණයගැති (CEB)" ගිණුමෙන් අඩු කර තිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන්, "තාප ගල් අඟුරු නැව්ගත කිරීම් සඳහා වෙළඳ ණයගැති (CEB)" ශේෂය සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරම් රු.මිලියන 285.3 කින් ඌණ ගණනය කර තිබුණි. | ලබන වසරේ ලැබෙන අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වේ. | සමාගම මූල්‍ය තොරතුරු නිසි ලෙස හෙළිදරව් කළ යුතුය. |

## 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැව්ගත කිරීමේ අංක 123 සඳහා සමාගම විසින් රු. මිලියන 136.2 ක මුදලක් රේගු වැට් බද්ද ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගු ප්‍රකාශනය අනුව සත්‍ය වැට් බද්ද රු. මිලියන 107 කි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමට රු.මිලියන 29.3ක් වැට් බද්දක් වැඩියෙන් දැරීමට සිදුව තිබුණි. | නවතම රේගු මුදල් ආපසු ඉල්ලීම 2021 පෙබරවාරි 10 දින සිදු කරන ලදී. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සමඟ සාකච්ඡා කිරීමෙන් පසු සමාගම වහාම ගැටලුව විසඳා ගත යුතුය. |

## 1.5.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ රු.මිලියන 2.6 ක හර ශේෂයක් දරණ සහ 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.මිලියන 4.7ක් වන අවිනිශ්චිත ගිණුමක ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.මිලියන 12 ක මුදලක් ඇතුලත්ව තිබුණි.සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් රු.මිලියන 1.6 ක මුදලක් හර කර රු.මිලියන 3.7 ක මුදලක් කිසිදු හේතුවක් නොමැතිව ඉහත අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා අංක – CEB/CIA/SA-33/2019-85 මත පදනම්ව 11422k -154 නැව්ගත කිරීමේ ගිණුමට රු.3,708,547ක් බැර කරන ලදී.11422k -154 නැව්ගත කිරීමේ ගිණුමට රු.1,594,325ක් හර කරන ලදී.මෙය ලංකා විදුලිබල මණ්ඩලය වෙත නොගෙවූ බත්තල් ගාස්තු වල වැට් බද්ද සඳහා නිකුත් කරන ලද 2020/07/17 දිනැති රු.15,870,104 බැර පත්‍රයේ ශේෂ වටිනාකමය.ලංකා ගල් අඟුරු සමාගම (LCC)විසින් 2019 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් වලට එරෙහිව රු. 14,275,779ක් දැනටමත් හිලව් කර ඇත. | සමාගම විසින් ශේෂයේ මූලාරම්භය සොයා බලා ඒ අනුව අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය.තවද, සාධාරණ පදනමකින් තොරව අවිනිශ්චිත ගිණුමට ගිණුම්කරණය කිරීම් වැළැක්විය යුතු අතර ගිණුම්කරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු අවසන් වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු සහ වෙළඳ ණයගැති ශේෂය පිළිවෙලින් රු.මිලියන 197.4 ක් සහ රු. මිලියන 12.1 ක් විය. කෙසේ වෙතත්, එය විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. එබැවින්, විගණනය සඳහා කිසිදු සාක්ෂියක් ලබා නොදීම නිසා වෙළඳ ණයගැති ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | දැනට ලංකා විදුලිබල මණ්ඩලය ගෙවිය යුතු ඉහත වැට් බද්ද මත කටයුතු කරමින් සිටින අතර නුදුරු අනාගතයේ දී පියවීමට නියමිතය.<br>වෙළඳ ණයගැතියෝ (CEB) - වාෂ්ප ගල් අඟුරු රු.12,073,788ක අන්තර්ගතය පහත දැක්වේ.<br>අ.ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.2,563,287<br>ආ.වෙළඳ ණයගැතියා (CEB) වාෂ්ප ගල් අඟුරු රු.7,750,000<br>ඇ.ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් දෑ රු.1,760,500<br><br>මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. | සමාගම ලංවිම සමඟ සාකච්ඡා කර ගැටලුව විසඳා ගත යුතු අතර ගිණුම්වල මූලාරම්භය වහාම සොයා ගත යුතුය. |
| (ආ)සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (TISCL) වෙතින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා ලැබිය යුතු රු.මිලියන 539.2ක දිගුකාලීන හිඟ ශේෂයක් අයකර ගැනීමට සමාගම අපොහොසත් වී ඇති අතර, හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකර නොතිබුණි. තවද, TISCL/CSCL විසින් මෙම ශේෂය තහවුරුකර නොතිබුණි.<br>එබැවින් ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කරගැනීමට නොහැකිවිය. | ඉහළ මට්ටමේ කමිටුවක් විසින් ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් බේරුම්කරණය හසුරුවන ලදී. කමිටුව ණය බොල් ණය බව කමිටුවේ මතය වී නොමැති අතර ගල් අඟුරු සැපයීමෙන් ණය පියවීමට ගැනුම්කරු එකඟ වී ඇත.<br>අප සතුව ඇති තොරතුරු අනුව බේරුම්කරණ යෝජනාව සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාවෙන් (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම) ලැබිය යුතු හිඟ මුදලේ වත්මන් තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, එහිදී සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය ,ලංකා ගල් අඟුරු සමාගම යන සිව් පුද්ගල කමිටුවක් පත් කර ඇත. තවද, එම කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇති කැබිනට් මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇත. | අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සමාගම පියවර ගත යුතුය. |
| (ඇ)විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු රු. මිලියන 578.7 ක් , විවිධ ණය | (i)ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC) රු.578,678,686 | සමාගම ආර්ථික සේවා ගාස්තු පනතට අනුකූල විය යුතු අතර ලංකා විදුලිබල |

| | | |
|---|---|---|
| ගැතියන් රු.මිලියන 18.1 ක් , සීමාසහිත නොබෙල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු රු.මිලියන 1.1 ක්, එම සමාගමට ගෙවිය යුතු රු.මිලියන 85.9 ක් සහ සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් (පුද්ගලික) සමාගම වෙතින් ලැබිය යුතු රු.මිලියන 8 ක SGS ගාස්තු සත්‍යාපනයට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | 31/12/2019 දිනට ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තුන්හි ආර්ථික සේවා ගාස්තු වගකීම අඩංගු වේ. ආර්ථික සේවා ගාස්තු පියවීම සඳහා අරමුදල් මුදා හැරීමට සිහි කැඳවීමට විදුලිබල මණ්ඩලයට ලිඛිතව ලිවීමට මණ්ඩලය තීරණය කර තිබුණි. | මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් වහාම අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| | (ii)විවිධ ණය ගැතියන් රු.18,075,802<br><br>මූලික විමර්ශනවලින් හෙළි වූයේ එම මුදල ආපසු අයකරගත නොහැකි NBT සහ PAL හි රු.17,839,949 ක් වන බවයි. මූලාශ්‍රය / මූලාරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. | සමාගම විසින් ලැබිය යුතු ශේෂයේ මූලාශ්‍රය සොයා බැලිය යුතු අතර, ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ණයහිමියන්ගේ ශේෂයන් තහවුරු කර අවශ්‍ය දේ සිදුකළ යුතුය. |
| | (iii) වෙළඳ ණයහිමියන් නොබෙල් රිසෝසස් රු.85,887,776<br><br>ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ ණයවර ලිපි (LC) වලංගු කාලසීමාව අවසන් වීම හේතුවෙන් සීමාසහිත නොබෙල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම විසින් ලබා ගන්නා ලද අඩු මුදලකි. නොබෙල් රිසෝසස් වෙතින් ලැබිය යුතු රු.1,115,987 යනු නොබෙල් රිසෝසස් සඳහා රු.85,887,776 ක මුදලක් සඳහා වන ණයහිමි ශේෂයක් වන අතර සහ අප මෙම ණයගැති ශේෂය එයට එරෙහිව පියවන්නෙමු. | |
| | (iv)සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් (පුද්ගලික) සමාගම වෙතින් ලැබිය යුතු 50% වූ SGS ගාස්තු රු.8,048,531<br><br>2015/16 වාරයේ නැව් අංක 17 සඳහා ගොඩබාන වරායේදී නැව් තොගයේ බර මිණුම්කරණ ගාස්තු ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනාව ලෙස රු. මිලියන 1.8 ක මුදලක් ගෙවා තිබුණි | පුද්ගලික සමාගමක් ලෙස ප්‍රසාද දීමනා ගෙවීම සඳහා 2020.11.30 දින මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | සමාගම චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |
| (ආ)රජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වගන්තිය 4.2.1 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව අවම වශයෙන් වසර තුනක් සඳහා අපේක්ෂා කරන ලද ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 වර්ෂයේ සිට සමාගම විසින් දරනු ලැබූ ශුද්ධ පොදුකාර්ය පිරිවැය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම හේතුවෙන්, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය පෙර වර්ෂයට අනුව බඳු පෙර ශුද්ධ ලාභයක් හෝ ශුද්ධ අලාභයක් නොවිය.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් විශ්ලේෂණය පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස වැඩි වීම හෝ අඩු වීම පහත පරිදි වේ.

| ආදායම/වියදම | 2020<br>රු. | 2019<br>රු. | ඉහලයාම/(පහලයාම)<br>රු. | ප්‍රතිශතය<br>% |
|---|---|---|---|---|
| ආදායම | 41,000,383,219 | 42,470,160,495 | (1,469,777,276) | (3.5) |
| විකුණුම් පිරිවැය | 40,954,618,074 | 42,414,953,867 | (1,460,335,793) | (3.4) |
| පරිපාලන වියදම් | 53,836,714 | 65,288,550 | (11,451,836) | (17.5) |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබූ අතර වත්කම් ලැයිස්තුවක් මයික්‍රොසොෆ්ට් එක්සෙල් (MS Excel) ලේඛනයක පවත්වාගෙන යනු ලබන අතර එය අනවසර වෙනස් කිරීම් අවදානමට ලක්විය හැකිය.එම ලේඛනයේ විදුලි උපකරණවල අනුක්‍රමික අංක අඩංගු නොවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම්හි සම්පූර්ණතාවය සත්‍යාපනය කළ නොහැක. | නිසි අනුක්‍රමික අංක පද්ධතියක් සහිත ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස බලයලත් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ස්ථාවර වත්කම් පවත්වාගෙන යාමේදී සුදුසු අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුකූලව 2015 සිට 2019 දක්වා වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළමනාකාරිත්ව අදහස් ලබා දී නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |